**ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල - 2023**
**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවසමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීමඅගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතාකර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 හි 47 ඡේදය ප්‍රකාරව, ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ඒවා සොයාගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි වරද සිදුවූ කාලච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවද, ඒ අනුව කටයුතු නොකර ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ පෙර වර්ෂ ගැලපීම් ලෙස රු.26,162,310ක ශේෂයක් 2023 ජනවාරි 01 දින ඉදිරියට ගෙනා සමුච්චිත අතිරික්තයට හා ප්‍රවර්තන වර්ෂයේ ඊට සම්බන්ධිත ගිණුම්වලට ගැලපීම් කර තිබුණි. | ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 27,28,33,48, සහ 54 ඡේද ප්‍රකාරව නිවැරදිව ගැලපීම් කර ඇති බව, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 27සහ 28 ඡේද ප්‍රකාරව අතීතානුයෝගීව නිවැරදි කිරීම යනු පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ගිණුම්වල ආරම්භක ශේෂ වලට ගැලපීම බව හා කිසිදු ආකාරයක අවතක්සේරුවක් හෝ අධි තක්සේරුවක් මූල්‍ය ප්‍රකාශන වලට සිදුවී නොමැති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 7හි 69 ඡේදය ප්‍රකාරව, වත්කම් භාවිතයට ගත් දිනයේ සිට ක්ෂය කිරීම් කළයුතු වුවත්, ඊට අනුකූල නොවන ලෙස වත්කම භාවිතයට ගත් දිනය නොසලකා වත්කම මිලදීගත් වර්ෂයට පසු වර්ෂයේ සිට ක්ෂය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තියක් අරමුදල විසින් ක්‍රියාත්මක කර තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 02, 71 හා 88ඡේද ප්‍රකාරව වත්කම් කළමණාකරණ ප්‍රතිපත්තිය නිවැරදිව හඳුනා ගෙන ඇති බව හා වත්කම් ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය අදාල ආයතනයේ කළමනාකාරීත්වයේ තීරණය මත නිර්නය කළ හැකි බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අක්ෂි බැංකුවට අදාලව වර්ෂය තුළ සිදුකර තිබුණු ප්‍රත්‍යාගණනයෙන් වූ ලාභය රු.27,714,909 ක් හා ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ උපචිත වියදම් වෙනුවෙන් පසුගිය වර්ෂයේ ප්‍රතිපාදිත එහෙත් සමාලෝචිත වර්ෂය තුළ වැය නොකල රු.202,309,478 ක මුදලක් වැරදි ආකාරයට වර්ෂයේ ආදායම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගැලපීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු.230,024,387 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3හි 27,28,33,48,54 ඡේද සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7හි 52 ඡේදය ප්‍රකාරව නිවැරදිව ගැලපීම් කර ඇති බව, සියලු ගැලපීම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ශේෂ පත්‍රයේ සුළු කොටස් හිමියන්ගේ අයිතියට බලපාන පරිදි සිදු කර ඇති බැවින් අරමුදලේ ආදායම් ලෙස හඳුනාගෙන නොමැති බව හා වර්ෂයේ අතිරික්තය අධි තක්සේරු කර නොමැති බව. | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක අමප/12/0489/509/022 දරන 2012 මැයි 04දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව උතුරු පළාතේ පිළිකා රෝගීන් සඳහා වූ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා (Trail Project) සෞඛ්‍ය අමාත්‍යාංශය, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල සහ ආධාරක ආයතනය වන භාරකාර සමාගමක් අතර එළඹ තිබුණු අවබෝධතා ගිවිසුම පරිදි මෙම ව්‍යාපෘතිය යටතේ තෙලිප්පලේ මූලික රෝහලේ විකිරණ ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම හා යාපනය ශික්ෂණ රෝහලේ ළමා ප්‍රතිකාර ඒකකය සඳහා වෛද්‍ය උපකරණ ලබාදීමට යෝජිතව පැවතුණි. තෙලිප්පලේ රෝහලේ ඉදිකිරීම වෙනුවෙන් යථෝක්තභාරකාර සමාගම රු.මිලියන 218.6ක් ආධාර වශයෙන් ලබා දී තිබුණි. ගිවිසුම අනුව Jaffna Project නමින් අදාල භාරකාර සමාගම විසින් එකතු කරනු ලැබූ ආධාර මුදල් සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් දේපලක් වන බැවින් 2023 මාර්තු 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ එසේ එකතු කළ රු.72,356,055ක මුදලක් ගිවිසුම ප්‍රකාරව යාපනය ශික්ෂණ රෝහලේ පිළිකා ඒකකය වැඩිදියුණු කිරීම සඳහා නොයොදවා එම සමාගම භාරයේ රඳවාගෙන තිබුණි. | ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ භාරකාර මණ්ඩලයේ තීරණය පරිදි අදාල භාරකාර සමාගම වෙතින් ලැබිය යුතු මුදල් ලබාගැනීම සඳහා නීතිපතිවරයාගේ මැදිහත්වීම ඉල්ලා 2024 ජූනි 14 දින ලිපියක් යවා ඇති බව. | මුදල් කඩිනමින් අයකරගෙන අරමුණුගත කාර්යයන් සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ සංස්ථාමය | පනතේ අරමුණු ඉටුකරගත හැකිවන ලෙස උපායමාර්ගික සැලැස්මක් | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මඟින් උපායමාර්ගික | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවලට |

| | | | |
|---|---|---|---|
| පාලනය සඳහා වන මාර්ගෝපදේශයේ 2.3 මාර්ගෝපදේශය | සකස් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාලව එවැනි සැලැස්මක් සකස්කර නොතිබුණි. | සැලැස්මක් සකස් කරමින් පවතින බව. | අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.371,298,795 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.164,877,522 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.206,421,273 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ අරමුදල් හා වෙනත් ලැබීම් වලින් සිදු කරන ලද වියදම් රු.1,297,970,382 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රිජ්වේ ආර්යා ළමා රෝහල සඳහා දස මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා උපකරණ මිලදීගැනීම වෙනුවෙන් Little Heart ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රැස් කරන ලද මහජන අරමුදල්වල එකතු වටිනාකම රු.624,435,910 ක් වුවද, එම මුදලින් වර්ෂය තුළ රු.81,397,296 ක් පමණක් වැයකර තිබුණි. | ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන ලෙස දන්වා අධ්‍යක්ෂ රිජ්වේ ආර්යා ළමා රෝහල වෙත සිහිකැඳවීම් යවා ඇති බව. | පරිත්‍යාග මුදල් කාර්යක්ෂමව යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2013 අගෝස්තු 29 දිනැති අංක අමප/13/1172/509/052 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව භාරයක් ලෙස ස්ථාපනය කිරීමට හා එකී භාරය ස්ථාපනය සඳහා ව්‍යවස්ථා පනවන තෙක් පවත්නා අවබෝධතා ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව ව්‍යාපෘතියක් වශයෙන් පවත්වාගෙනයාමටත් විශේෂ පුහුණුව ලද වෘත්තීයවේදීන් රඳවාගැනීමට හැකිවනු පිණිස විදේශාධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා කාර්යමණ්ඩල බඳවාගැනීමේදී අනුගමනය කලයුතු කොන්දේසි නියම කර ඇති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව බඳවාගැනීමේ පටිපාටි සකස් කිරීම සහ එකී චක්‍රලේඛය මාර්ගෝපදේශයක් වශයෙන් යොදාගනිමින් අක්ෂි බැංකුව වෙත ලැබෙන ප්‍රදානයන් උපයෝගී කරගනිමින් වැටුප් ගෙවීමටත් තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ. | | |

| | | |
|---|---|---|
| (i) සිංගප්පූරුවේ Asia Cornea Foundation ආයතනය සමඟ 2010 වර්ෂයේදී එළඹ තිබුණු අවබෝධතා ගිවිසුම හා යථෝක්ත අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව, 2023 ඔක්තෝබර් 17 දිනැති 2023 අංක 22 දරන ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාරය පනත මගින් වෙනම ආයතනික ව්‍යුහයක් සහිත ඒකකයක් වශයෙන් ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාරය ස්ථාපිත කර තිබුණද පනතේ විධිවිධානවලට අනුකූලව සමාලෝචිත වර්ෂයට අදාලව ගනුදෙනු වාර්තා කිරීම සඳහා වෙනම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් ගිණුමේ ව්‍යාපෘතියක් ලෙස ගනුදෙනු වාර්තා කර තිබුණි. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 12/2003 අනුව ආයතනයක් ස්ථාපනය වීම සඳහා දැක්ම, මෙහෙවර සහ අරමුණු ඇතුලත් සංස්ථාමය සැලැස්මක් පිළියෙල කර ඊට අනුකූලව ආයතනය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය නිර්ණය කර තනතුරු ඇතිකර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන බඳවා ගැනීම් පටිපාටි පිළියෙල කර බඳවා ගැනීම් සිදුකළ යුතු බව, අරමුදලේ සහ ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාරයේ භාරකාර මණ්ඩලය භාරය ස්ථාපිත වන තුරු අරමුදලේ ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙනයාම අනුමත කර ඇතිබව හා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අවශ්‍ය ව්‍යවස්ථාපිත පසුබිමක් නොමැති බව. | ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාරය පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ii) ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව සඳහා කාර්යමණ්ඩල බඳවා ගැනීමේ පටිපාටි සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට විගණිත දිනය වන 2024 ජූලි 15 තෙක් කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 12/2003 අනුව සංස්ථාමය සැලැස්මට අනුකූලව තනතුරු ඇතිකර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්ව සේවකයන් බඳවා ගත යුතු බව හා සංස්ථාමය සැලැස්ම සැකසීම සඳහා මිල ගණන් කැඳවා තාක්ෂණික කමිටුවේ ඇගයීමට ඉදිරිපත් කර ඇති බව. | කාර්යමණ්ඩල බඳවා ගැනීමේ පටිපාටි සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමටකටයුතු කළ යුතුය. |
| (iii) යථෝක්ත චක්‍රලේඛයේ 1.1 ඡේදයේ සඳහන් විධිවිධානයන්ට අනුව අවශ්‍ය කොන්දේසි සපුරා නොතිබීම හේතුවෙන් අක්ෂි බැංකුව විදේශාධාර ව්‍යාපෘතියක් ලෙස හඳුනාගත නොහැකිව තිබියදී ලෝක සෞඛ්‍ය සංවිධානයේ අරමුදල් මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති මගින් පවත්වනු ලබන රැස්වීම්, වැඩමුළු, පුහුණු වැඩසටහන් ආදියෙහි සම්පත් දායකයින්, සහභාගිවන්නන්, දේශකවරු සහ දායකවන අනෙකුත් නිලධාරීන් සඳහා ගෞරව දීමනා, දෛනික දීමනා සහ දේශන ගාස්තු ගෙවීම් සම්බන්ධයෙන් නිකුත්කර තිබුණු 2022 දෙසැම්බර් 22 දිනැති අංක 1822/11 දරන සෞඛ්‍ය අමාත්‍යාංශයේ පොදු | සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන විදේශාධාර මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල සේවය කරන වෘත්තිකයන්ගේ සේවය සඳහා අමාත්‍ය මණ්ඩලයේ හා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය සහිතව නිකුත් කර ඇති බැවින් චක්‍රලේඛය සඳහා නැවත මහා භාණ්ඩාගාරය හෝ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියක් අවශ්‍ය නොවන බව හා ජාතික අක්ෂි බැංකුව සමාලෝචිත වර්ෂයේදී විදේශවලින් කුනිත සඳහා ලැබෙන ප්‍රදානයන් මගින් පවත්වාගෙන යනු | ගෙවීම් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල හා මහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | චක්‍රලේඛය පදනම් කරගෙන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත එක් නිලධාරියෙකුට මසකට දින 14ක් බැගින් වන පරිදි ගෞරව දීමනාවක් ගෙවීම්කර තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුවේ නිලධාරීන් 23දෙනෙකු, සෞඛ්‍ය අමාත්‍යාංශයේ හා සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ නිලධාරීන් 08දෙනෙකු ඇතුළුව නිලධාරීන් 31දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.2,990,400 ක් ගෙවීම් කර තිබුණි. දීමනා ගෙවීම් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතියක්හෝ මහා භාණ්ඩාගාර අනුමැතියක් ලබා නොතිබුණි. | ලබන බැවින් එහි සේවය කරන සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල් සහ ආයතනවල වෘත්තිකයන් හට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වන සෞඛ්‍ය ලේකම්ගේ අනුමැතිය යටතේ ගෙවීම් කරනු ලබන බව. | |
| (ඇ ) | 2023 දෙසැම්බර් 31 දිනට අපේක්ෂා රෝහල සඳහා වූ පරිත්‍යාග ගිණුමේ රු.406,243,364 ක මුදලක් ඉතිරිව පැවති අතර 2022 හා 2023 වර්ෂයන්හිදී කිසිදු ඵලදායී කාර්යයක් සඳහා මෙම අරමුදල් භාවිතා කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | අපේක්ෂා රෝහල සඳහා ළමා වාට්ටුවක් ඉදිකිරීම හා Thermo Therapy යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා පිළිවෙලින් 2015 හා 2019 වර්ෂයන්හිදී ලැබී තිබුණු එකතුව රු.153,540,440 ක මහජන ආධාර මුදල් අදාල අරමුණු ඉටුකිරීම වෙනුවෙන් යොදවා නොතිබුණි. | 1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනතේ 6 සහ 7 (ඇ) වගන්ති අනුව විශේෂ යෝජනා ක්‍රමයක් වෙනුවෙන් ලැබෙන පරිත්‍යාග අරමුදල වෙත බැර කෙරෙන අතර එම විශේෂ ව්‍යාපෘති සඳහා රජයේ විධිවිධාන වලට අනුකූලව ගෙවීම පමණක් අරමුදලේ කාර්ය බව, එම විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීමේ බලධරයා වනුයේ අදාල පරිත්‍යාග ලබන ආයතන ප්‍රධානීන් බව හා Thermo Therapy යන්ත්‍රය සඳහා ලැබී ඇති පරිත්‍යාග ඇතුළු පරිත්‍යාග CT Simulator ස්ථාපනය කිරීම සඳහා යොදා ගන්නා බව. | පරිත්‍යාග ලෙස ලැබුණු මුදල් කාර්යක්ෂමව යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 2022 වර්ෂයේදී අපේක්ෂා රෝහලේ අධ්‍යක්ෂ විසින් කරන ලද ඉල්ලීමට අනුව පැවති ආර්ථික අර්බුදය හමුවේ රෝගී සත්කාර සේවය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා Thermo Therapy යන්ත්‍රයක් මිලදී ගැනීමට රැස්කළ ආධාර මුදල් හා Pet Scan යන්ත්‍රයක් මිලදී ගැනීමෙන් පසුව ඉතිරි වූ මුදල් | 2023 නොවැම්බර් 02දින නියෝජ්‍ය අධ්‍යක්ෂ (ජීව විද්‍යා) විසින් දන්වා ඇති පරිදි CT Simulator යන්ත්‍රයට අදාල මාදිලියේ වෙනසක් නිසා කැඳවා තිබුණු ටෙන්ඩරය අවලංගු කර නැවත ටෙන්ඩර කැඳවන බව. GE | එම |

| | | | |
|---|---|---|---|
| | උපයෝජනය කර ඇස්තමේන්තුගත පිරිවැය රු.202,309,478 ක්වූ CT Simulators යන්ත්‍රයක් මිලදී ගැනීම, එම යන්ත්‍රය ස්ථාපිත කිරීමට අවශ්‍ය ගොඩනැගිල්ල ඉදිකිරීම සහ Sonial Vision x - ray යන්ත්‍රය ස්ථාපිත කිරීමට නියමිත ගොඩනැගිල්ල සඳහා විදුලි සැපයුම ලබා ගැනීම යන කාර්යයන් ඉටු කිරීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිටත් කටයුතු කර නොතිබුණි. | 68 Calibration Phantom for Pep CT Machine ක්‍රියාමාර්ග ගන්නා ලෙස අපගේ 2023 දෙසැම්බර් 28 දිනැති ලිපියෙන් දන්වා ඇත. | |
| (ඈ) | 1998 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අරමුදල වෙත විවිධ ව්‍යාපෘති 04 කට අදාලව ලැබී තිබුණු රු.13,758,807 ක් වූ පරිත්‍යාග අරමුණුගත කාර්යයන් ඉටුකිරීම සඳහා යෙදවීමට කටයුතු නොකර පරිත්‍යාග ගිණුමේ රඳවාගෙන තිබුණි. | කිරිගෝරිස් අප්පුහාමි අරමුදල තංගල්ල මූලික රෝහලේ රෝගී වැසිකිළි පිළිසකර කිරීම සඳහා යොදා ගන්නා බව, තැලසීමියා රෝගීන් සඳහා වූ මහජන අරමුදල අවශ්‍ය වූ විට ලබා ගැනීම සඳහා රඳවා තබා ගන්නා ලෙස දැනුම් දී ඇති බව හා කොවිඩ් මර්ධන වැඩසටහන් වෙනුවෙන් ලැබී ඇති මුදල එම වැඩසටහන් වෙනුවෙන් පමණක් යොදාගත හැකි බැවින් භාරකාර මණ්ඩලයේ මහපෙන්වීම යටතේ වියදම් යොමුකරන ලෙස ප්‍රධාන මූල්‍ය නිළධාරී වෙත දැනුම් දී ඇති බව. | අරමුණුගත කාර්යයන් ඉටුකිරීම සඳහා පරිත්‍යාග මුදල් කාර්යක්ෂමව යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | රිජ්වේ ආර්යා ළමා රෝහලේ ශල්‍යාගාර සංකීර්ණය වැඩිදියුණු කිරීම සඳහා පරිත්‍යාගශිලියෙකු විසින් 2020 වර්ෂයේ ලබාදී තිබුණු රු.42,035,398 ක් හා ශල්‍යකර්ම සඳහා අවශ්‍ය පරිභෝජන ද්‍රව්‍ය මිළදීගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු රු.11,250,000 ක පරිත්‍යාග මුදල් අදාල කාර්යයන් ඉටුකිරීම සඳහා යෙදවීමට කටයුතු කර නොතිබුණි. | Little Heart ව්‍යාපෘතියේ මුදල් සහ පරිභෝජන ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වන මුදල් College of Pediatrician මඟින් සිදුකරනු ලබන අතර ඔවුන්ගේ ඉල්ලීම පරිදි රිජ්වේ ආර්යා රෝහල වෙත ලබා දෙන බව. | අරමුණුගත කාර්යයන් සඳහා පරිත්‍යාග මුදල් කාර්යක්ෂමව යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2019 හා 2020 වර්ෂයන්හි ව්‍යාපෘති කාර්යයන් නිමකල ව්‍යාපෘති 03කට අදාලව එකතුව රු.9,324,047 ක ඉතිරි මුදල් ඵලදායී ලෙස යොදා ගැනීමට කටයුතු කිරීමකින් තොරව තවදුරටත් පරිත්‍යාග ගිණුමේ රඳවාගෙන තිබුණි. | Fellowship programme for Korean Doctors ඉතිරි මුදල අතිරේක ලේකම් මහජන සම්බන්ධතා විසින් රඳවා තබා ගන්නා ලෙස දැනුම් දී ඇති බව, රත්නපුර රෝහල සඳහා PCR යන්ත්‍රයේ ඉතිරි මුදල මුළුතැන්ගෙය නවීකරණය සඳහාත්, හම්බන්තොට දිස්ත්‍රික් PCR යන්ත්‍රය සඳහා ඉතිරි මුදල රෝගීන් බැලීමට පැමිණෙන ජනතාව වෙනුවෙන් අසුන් ගැනීමට | අරමුදල් ඵලදායී ලෙස යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ස්ථානයක් සැකසීමට හා යතුරුපැදි නවතා තැබීමට අංගනයක් ඉදිකිරීමටත් කටයුතු කරන බව. | |
| (ඇ) | 2005 වර්ෂයේදී මීගහකිවුල රෝහලේ වාට්ටු සංකීර්ණය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් නොකිරීම හේතුවෙන් අවලංගු කරනු ලැබූ වටිනාකම රු. 1,372,346 ක්වූ කාර්යසාධන සුරක්ෂණ ඇපකරය රක්ෂණ ආයතනය විසින් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. ඊට වගකිවයුතු පාර්ශවයන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණු අතර පාලක මණ්ඩල තිරණයක් මත සමාලෝචිත වර්ෂයේදී එම මුදල බොල්ණය ලෙස කපාහැර තිබුණි. | මෙම කාර්යසාධන සුරක්ෂණ ඇපකරය කල් ඉකුත් වී ඇති බව, මේ සඳහා අරමුදලේ සේවකයන් වගකිවයුතු පාර්ශවයක් ලෙස නම් කල නොහැකි බව හා අරමුදලේ භාරකාර මණ්ඩලය කරුණු අධ්‍යනය කර මෙය අරමුදලේ ගිණුම් වලින් කපා හැරීමට තීරණය කර ඇති බව. | රජයට සිදුවූ පාඩුව සඳහා වගකිවයුතු පාර්ශවයන් හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අම්පාර මහ රෝහල සතු ගොඩනැගිල්ලක් අළුත්වැඩියා කර ගෙවන වාට්ටුවක් ස්ථාපිත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාදී තිබුණද ගොඩනැගිල්ල අළුත්වැඩියා කරනවා වෙනුවට කාමර 8කින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා සෞඛ්‍ය සංවර්ධන අරමුදලින් රු .මිලියන 18.20ක් වැයකර තිබුණි. 2017 වර්ෂයේදී මෙම ගෙවන වාට්ටුව ස්ථාපිත කර තිබුණු අතර අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව ගෙවන වාට්ටු ආදායමින් සියයට 60ක් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලටත් ඉතිරිය ඒකාබද්ධ අරමුදලටත් බැර කිරීමට තීරණය කර තිබුණි. 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.2,113,932 ක මුදලක් ගෙවන වාට්ටුවේ ආදායම් ලෙස අරමුදල වෙත ලැබී තිබුණද, පසුගිය වර්ෂ දෙකක කාලයක් තුල ආදායම් නොලබා නිශ්කාර්යව පැවතුණි. | සමාලෝචිත වර්ෂයේ රටේ උද්ගතව පැවති තත්ත්වය හේතුවෙන් ගෙවන වාට්ටුව සඳහා රෝගීන් ඇතුලත් වී නොමැති බැවින් ආදායම් ලබා නොමැති බව හා ගෙවන වාට්ටු සක්‍රීය ලෙස පවත්වා ගෙන යන ලෙස සෞඛ්‍ය ලේකම් හා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් මගින් දන්වා ඇති බව. | ගෙවන වාට්ටුව සඳහා වූ අවශ්‍යතාවයන් සම්පූර්ණ කර නියමිත ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පාලක මණ්ඩලය විසින් අනුමත කළ අරමුදලේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මගින් ඉටුකර ගැනීමට නොහැකිවූ කාර්යයන්ද ඇතුළුව ඇස්තමේන්තුගත පිරිවැය රු.204,037,268 ක්වූ ව්‍යාපෘති කාර්යයන් වර්ෂය තුල ඉටුකිරීමට අපේක්ෂා කර තිබුණද එම අනුමැතියට පටහැනිව පිරිවැය රු. 61,368,422 ක්වූ කාර්යයන් 02ක් ඉටුකිරීම අවශ්‍ය නොවන බව අපේක්ෂා රෝහලේ අධ්‍යක්ෂ විසින් දන්වා තිබුණු අතර රු.49,000,000 ක පිරිවැය වූ කාර්යයක් වර්ෂය තුල ඉටුකර නොතිබුණි. ඒ අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අපේක්ෂිත පරිදි අරමුදලේ අරමුණු ඉටුකරගැනීම සඳහා ඵලදායී ලෙස යොදාගත නොහැකි වී තිබුණි. | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ අඩංගුව තිබූ අපේක්ෂා රෝහලේ ක්‍රියාකාරකම් 02ක් අරමුදලෙන් සිදුකිරීම අවශ්‍ය නොවන බව දන්වා අදාල වවුචර්පත් අපේක්ෂා රෝහල මගින් නැවත ලබා ගන්නා ලද බව හා එක් කාර්යයක් 2024 මූල්‍ය වර්ෂයේ Ongoing Activities ලෙස දක්වා ඇති බව. | අරමුදලේ අරමුණු ඉටුකර ගැනීමට හැකිවන පරිදි ක්‍රියාවේ යෙදවිය හැකි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

(ඇ) ජාතික අක්ෂි බැංකුවේ 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ කාර්යසාධනය පහත දැක්වේ.

| **වෂර්ය** | **2021** | | | **2022** | | | **2023** | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| එකතු කරනු ලැබූ අක්ෂි පටල (කුනීත) සංඛ්‍යාව | 665 | | | 1010 | | | 1107 | | |
| අක්ෂි පටල (කුනීත) භාවිතය | **ඉල්ලුම** | **සැපයුම** | **සැපයුම් ප්‍රතිශතය** | **ඉල්ලුම** | **සැපයුම** | **සැපයුම් ප්‍රතිශතය** | **ඉල්ලුම** | **සැපයුම** | **සැපයුම් ප්‍රතිශතය** |
| රජයේ රෝහල් | 686 | 294 | 43 | 767 | 454 | 59 | 1054 | 518 | 49 |
| පෞද්ගලික රෝහල් | 256 | 124 | 48 | 357 | 195 | 55 | 378 | 191 | 50 |
| විදේශීය රටවල්වලට අලෙවිකිරීම් | 269 | 223 | 83 | 344 | 325 | 94 | 338 | 323 | 95 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| (i) 2021 හා 2022 වර්ෂවලට සාපේක්ෂව 2023 වර්ෂයේදී අක්ෂි බැංකුව විසින් එකතු කරනු ලැබූ අක්ෂි කුනීත සංඛ්‍යාව පිළිවෙලින් සියයට 66කින් හා සියයට 9.6කින් වැඩි වී තිබුණු අතර 2023 වර්ෂයේ එකතු කළ 1107 ක් වූ අක්ෂි කුනීතවලින් 75 ක් එනම් සියයට 7ක් කල් ඉකුත්වීම හෝ බද්ධ කිරීම සඳහා නුසුදුසු තත්ත්වයේ පැවතීම හේතුවෙන් භාවිතයෙන් ඉවත් කිරීමට සිදුව තිබුණි. අක්ෂි පටලවල නුසුදුසුභාවය පිළිබඳ පරීක්ෂණ වාර්තා 08 ක් පමණක් බාහිර ආයතනවලින් ලබාගෙන තිබුණු අතර අනෙකුත් අක්ෂි පටල පරීක්ෂණ වාර්තා ආයතනයේ අභ්‍යන්තරයෙන් පමණක් ලබාගෙන ඒ මත තීරණ ගෙන තිබුණි. | ජාතික අක්ෂි බැංකුව සීමිත සේවක සංඛ්‍යාවක් සමඟින් කටයුතු කරනු ලබන බව, ජාතික අක්ෂි බැංකුව වැඩි අවධානයක් යොමු කරන්නේ දේශීය කුනීත සැපයීම් සඳහා බව, | වර්ෂය තුළ රැස්කරන අක්ෂි කුනීත සංඛ්‍යාව වර්ධනය කර ගැනීම සඳහා හා ඒවායේ ආරක්ෂාව සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ii) 2021, 2022 හා 2023 වර්ෂයන් හිදී රජයේ රෝහල් වලින් කරන ලද ඉල්ලුමෙන් පිළිවෙලින් සියයට 43 ක්, සියයට 59 ක් හා සියයට 49 ක් පමණක් සැපයීම් කර තිබුණු අතර පෞද්ගලික රෝහල්වලින් අක්ෂි කුනීත සඳහා කරන ලද ඉල්ලුමෙන් සියයට 48 සිට සියයට 55 දක්වා වූ පරාසයක ප්‍රමාණයක් හා විදේශීය රටවලින් කරන ලද ඉල්ලුමෙන් සියයට 83 සිට සියයට 95 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයක් සැපයීමටත් කටයුතු කර තිබුණි. 2023 අංක 22 දරන ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාර පනතේ අරමුණුවල දක්වෙන පරිදි රජයේ රෝහල්වලට නොමිලේ අක්ෂි කුණිත සැපයීමටත් අතිරික්තය වෙනත් රටවලට නියමකරනු ලැබිය හැකි පිරිසැකසුම් ගාස්තුවක් මත ලබාදීමටත් හැකියාවක් පැවතුණද අක්ෂි බැංකුව රජයේ | ජාතික අක්ෂි බැංකුව සීමිත සේවක සංඛ්‍යාවක් සමඟින් කටයුතු කරනු ලබන බව, ජාතික අක්ෂි බැංකුව වැඩි අවධානයක් යොමු කරන්නේ දේශීය කුනීත සැපයීම් සඳහා බව, | දේශීය අක්ෂි කුනීත අවශ්‍යතාවය සපුරාලීමට ප්‍රමුඛතාවය ලබා දිය යුතුය. |

රෝහල්වල අවශ්‍යතාවය ඉටුකිරීමට වඩා විදේශිය රටවල ඉල්ලුම සැපයීමට වැඩි අවධානයක් යොමු කර තිබුණි.

### 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා නංවාලීම වෙනුවෙන් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල සතු පොදු අරමුදල් උපයෝජනය කරගැනීම දූර්වල තත්ත්වයක පැවතුණු බව නිරීක්ෂණය වූ අතර 2023 දෙසැම්බර් 31 දින වනවිට පොදු අරමුදලේ සමුච්චිත ආදායම රු.729,412,012 ක් වූ අතර පනතේ අරමුණු ඉටුකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී පොදු අරමුදල් වලින් වැයකර තිබුණු මුදල රු.60,614,018 ක් පමණක් විය. මේ අනුව අරමුදලේ මුදල් උපයෝජනය සියයට 8.3 ක පහළ මට්ටමක පැවතුණි. | ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ 2.2.1 ඡේදය ප්‍රකාරව අවිච්ඡින්න පැවැත්ම තහවුරු කරමින් අරමුදලේ මුදල් උපයෝජනය කරනු ඇති බව. | අදාල ආයතන දැනුවත් කර අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කළ යුතුය. |
| (ආ) | 2010 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ රු.674,624,055 ක් ලොතරැයි ආදායම ලෙස ලැබී තිබුණු අතර ලොතරැයිය ආරම්භයේදී රෝහල් උපකරණ මිලදීගැනීම හා රෝහල් අළුත්වැඩියා කිරීම සඳහා මෙම ආදායම් යෙදවිය යුතු බවට තීරණය කර තිබුණද එම අරමුණුගත කාර්යයන් ඉටුකිරීම සඳහා 2023 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ පිළිවෙලින් රු.95,053,462 ක් හා රු.332,146,734 ක් ලෙස එකතුව රු.427,200,196 ක් පමණක් වැයකර තිබුණි. | 1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ 7 ඡේදය ප්‍රකාරව අරමුදලේ අරමුණු සඳහා ලොතරැයි ආදායම වූ රු.674,624,055 න් රු.629,241,009 ක් වැයකර තිබුණු බව හා ලොතරැයි ආදායම් උපයෝජනය සියයට 93 වැනි ඉහල මට්ටමක පවතින බව. | ලොතරැයිය ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂිත අරමුණු ඉටුකිරීම සඳහා ලොතරැයි ආදායම භාවිතා කළ යුතුය. |